කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය — I

කාලය: පැය එකයි

නම: ...............................................................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ ,
   i. ඉංග්‍රීසි විප්ලවයෙන් පසුවය
   ii. ප්‍රංශ විප්ලවයෙන් පසුවය
   iii. ඇමරිකන් විප්ලවයෙන් පසුවය
   iv. රුසියන් විප්ලවයෙන් පසුවය

2) වර්තමාන ශ්‍රී ලංකාවේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ අනුව සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වන අවස්ථාවක් වන්නේ,
   i. ජනාධිපති වරණයේදී ය.
   ii. ජනමත විචාරණයේදී ය.
   iii. ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ය.
   iv. පළාත් සභා මැතිවරණයේදී ය.

3) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියෙකු විසින් සමාජය වෙත ඉටුකළයුතු යුතුකම් වර්ග දෙක වන්නේ,
   i. සංස්කෘතික හා ආගමික යුතුකම් ය.
   ii. ආර්ථික හා සාමාජීය යුතුකම් ය.
   iii. නීතිමය හා සදාචාරාත්මක යුතුකම් ය
   iv. සිවිල් හා දේශපාලන යුතුකම් ය.

4) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා ප්‍රධාන නිර්ණායක ලෙස භාවිතා කරනු ලබන්නේ,
   i. ජාතිය හා ආගමයි.
   ii. භූමිය හා ජනගහනයයි
   iii. ජාතිය හා භූමියයි
   iv. ග්‍රාමීය හා නාගරික බවයි

5) මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම ,
   i. අයිතිවාසිකම් ලෙස හඳුන්වයි.
   ii. යුතුකම් ලෙස හඳුන්වයි.
   iii. නිදහස ලෙස හඳුන්වයි.
   iv. වගකීම් ලෙස හඳුන්වයි.

6) රාජ්‍යයක කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන නියෝජිතයා ,
   i. විධායකයයි.
   ii. පාර්ලිමේන්තුවයි
   iii. අධිකරණයයි
   iv. ආණ්ඩුවයි

7) නාමික විධායකය හා දේශපාලන විධායකය යන අංශ දෙකින් සැදුම්ලත් ආණ්ඩුක්‍රමය ,
   i. ජනාධිපති ආණ්ඩුක්‍රමයයි
   ii. රාජාණ්ඩු ක්‍රමයයි
   iii. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයයි
   iv. ජාතික ආණ්ඩුක්‍රමයයි

8) බලය බෙදා හැරීමේදී මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක විධායක අධිකරණ යන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම සිදු කරනු ලබන්නේ,
   i. විධායකය මඟිනි.
   ii. අධිකරණය මඟිනි.
   iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟිනි.
   iv. පාර්ලිමේන්තුව මඟිනි.

9) පොලොන්නරු යුගය තුළ මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රාදේශීය පාලකවරුන් පත් කිරීම හා ඔවුන්ට පාලන බලතල ලබාදීම ,

i. බලය බෙදා හැරීමට උදාහරණයකි.   ii. බලය ලබා ගැනීමට උදාහරණයකි.
iii. බලය ඒකරාශී කිරීමට උදාහරණයකි.   iv. බලය විමධ්‍යගත කිරීමට උදාහරණයකි.

10) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ප්‍රධාන නීති නිලධාරී වන්නේ,

i. නීතිපති තුමා ය.   ii. අග්‍රවිනිශ්චයකාර තුමා ය.
iii. කතානායක තුමා ය.   iv. අධිකරණ ඇමති තුමා ය.

11) 2012 ජන සංගණනය අනුව සිංහල ජන වර්ගයට අයත් ජනතා ප්‍රතිශතය,

i. 11.2%   ii. 69.5%   iii. 74.9%   iv. 70.2%

12) ධනවාදී ආර්ථික ක්‍රමයක් හා සමාජවාදී ආර්ථික ක්‍රමයක් පවතින රටවල් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. ජපානය හා උතුරු කොරියාව   ii. ඇමරිකා එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියාව
iii. කියුබාව හා චීනය   iv. මහා බ්‍රිතාන්‍ය හා ශ්‍රී ලංකාව

13) වෙළඳ පොළ ආර්ථිකය ලෙස වර්තමානයේ ක්‍රියාත්මක වන ක්‍රමය නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ලෙස හැඳින්වේ. මෙහි දක්නට ලැබෙන ලක්ෂණය වන්නේ,

i. පෞද්ගලික අංශයට කළ හැකිදේ රජය විසින් ද කරනු ලබයි.
ii. රජයේ පූර්ණ මැදිහත් වීමක් මඟින් වෙළඳපොළ ක්‍රියාත්මක වීමට ඉඩ සලසයි.
iii. රජය අවම මැදිහත් වීමක් මඟින් වෙළඳපොළ ක්‍රියාත්මක වීමට ඉඩ සලසයි.
iv. දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්වීමක් සිදු නොකරයි.

14) ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වන අවස්ථාවකට උදාහරණයකි.

i. වර්ෂා ජලය කෘෂිකාර්මික කටයුතු වලට යොදා ගැනීම
ii. හිරු එළිය ලබා ගැනීම සඳහා මුහුදු වෙරළට යාම.
iii. වෙළඳපොළෙන් බෝතල් කළ පානීය ජලය ලබා ගැනීම
iv. විදුලිය නිපදවීම සඳහා හිරු එළිය භාවිතා කිරීම.

15) තිරසාර සංවර්ධනය සම්බන්ධ පුරවැසි යුතුකමක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?

i. පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම   ii. පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම
iii. පරිසර බලපෑම් තක්සේරු කිරීම   iv. අධි පරිභෝජනයෙන් වැලකීම

16) A - විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
B - ලෝක ආර්ථිකයේ වෙනස් කම් වලට සෘජුවම මුහුණ දීම
C - බුද්ධි ගලනය වේගවත් වීම
D - ජාත්‍යන්තර වෙළඳපොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහිවීම

ඉහතින් දක්වා ඇති ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවටඇතිවී තිබෙන බලපෑම් තුළින් ධනාත්මක බලපෑම් සඳහන් පිළතුර තෝරන්න.

i. A හා B   ii. A හා D   iii. B හා C   iv. A හා C

17) යැපුම් කෘෂිකර්මයේ දී අනුගමනය කළ යුතු වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ,

i. ආරක්ෂක කටයුතු තරකොට ගැටුම් ඇතිවීම වැළැක්වීම
ii. ගැටුමට මුල් වූ සාධක මුලිනුපුටා දැමීම
iii. සාකච්ඡා සඳහා තුන්වන පාර්ශවයක් සම්බන්ධ කර ගැනීම
iv. ගැටුම් වලින් මඟහැර යාමට ක්‍රියා කිරීම

18) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන සම්ප්‍රදායානුකූල ක්‍රමයකි.

i. විනිසීම   ii. බේරුම් කිරීම   iii. සමථකරණය   iv. උපදේශනය

19) තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා සම්පූර්ණ කරගත යුතු අවශ්‍යතා වන්නේ,
   i. ආර්ථික අවශ්‍යතා, සංස්කෘතික අවශ්‍යතා, පාරිසරික අවශ්‍යතා
   ii. මූල්‍යමය අවශ්‍යතා, සාමාජීය අවශ්‍යතා, ආර්ථික අවශ්‍යතා
   iii. පාරිසරික අවශ්‍යතා, සාමාජීය අවශ්‍යතා, ආර්ථික අවශ්‍යතා
   iv. පාරිසරික අවශ්‍යතා, මූල්‍යමය අවශ්‍යතා, ආර්ථික අවශ්‍යතා

20) මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීමට යාමේදී ගැටළු ඇති වීමට ප්‍රධාන හේතුවක් වන්නේ,
   i. අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් ප්‍රමාණවත් නොවීම
   ii. අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දැනුම ප්‍රමාණවත් නොවීම
   iii. අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය සම්පත් සීමිත වීම
   iv. පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා වෙනස්වීම

21) "නීතිය යනු පරමාධිපත්‍ය දේශපාලන අධිකාරියක් විසින් නිතුත් කරනු ලබන ආඥාවක් වන අතර එය කඩ කිරීම දඬුවමට හේතු වේ".යන නිර්වචනය ඉදිරිපත් කළේ,
   i. ජෝන් ඔස්ටින් ය.   ii. ටී. එච්. ග්‍රීන් ය.   iii. ඒබ්‍රහම් ලින්කන් ය.   iv. සීලර් ය.

22) රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය වන්නේ එම රටෙහි,
   i. දණ්ඩ නීති සංග්‍රහයයි.   ii. විවිධ අණ පණත් ය.
   iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ය   iv. මූලික අයිතිවාසිකම් ප්‍රඥප්තිය යි

23) පහත "අ" කොටසේ වගන්ති "ඉ" කොටස හා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ඉ |
|---|---|
| i. පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය | A - මහාධිකරණ |
| ii. රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ පිළිබඳ අධිකරණ බලය | B - දිසා අධිකරණය |
| iii. රජයේ සේවකයන් සම්බන්ධ වැරදි පිළිබඳ අධිකරණ බලය | C - අභියාචනාධිකරණය |
| iv. හදිසි අනතුරු වන්දි හා රක්ෂණ නඩු සම්බන්ධ අධිකරණ බලය | D - මහේස්ත්‍රාත් අධිකරණය |

   i. ADBC   ii. CADB   iii. ACBD   iv. CABD

24) මරණ දඬුවමනියම වූවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ ජනාධිපතිවරයාට භාරදීම
   i. නීතිපතිතුමාගේ කාර්යයකි.
   ii. අග්‍රවිනිශ්චයකාරතුමාගේ කාර්යයකි.
   iii. අධිකරණ අමාත්‍යතුමාගේ කාර්යයකි.
   iv. සොලිස්ටර් ජනරාල්තුමාගේ කාර්යයකි.

25) A- බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර ධූරයක් ඇතිකිරීම
   B- මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ප්‍රථම වරට ඇතුළත් කිරීම
   C- පාර්ලිමේන්තු කොමසාරිස් ධූරයක් ඇතිකිරීම
   D- රාජ්‍ය සේවා හා අධිකරණ සේවා කොමිෂන් සභා පිහිටුවීම
   ඉහත සඳහන් වගන්තිවලින් 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ හඳුන්වා දී ඇති ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙකක් තෝරන්න.
   i. A හා C   ii. A හා B   iii. B හා C   iv. A හා D

26) ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම සඳහාම පළාත් සභා පිහිටු වීමට කටයුතු සම්පාදනය කළේ,
   i. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවය.   ii. 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවය.
   iii. 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවය.   iv. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවය.

27) 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සතු බලතල ලැයිස්තු යටතේ මධ්‍යම ආණ්ඩුවට හා පළාත් සභාවලට සමසේ භුක්ති විදිය හැකි බලතල ඇතුළත් ලැයිස්තුව වන්නේ,

i. 11 ලැයිස්තුව ii. 1 ලැයිස්තුව iii. 1V ලැයිස්තුව iv. 111 ලැයිස්තුව

28) 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි වන්නේ,

i. ජනාධිපතිවරයාට අවශ්‍ය ඕනෑම අවස්ථාවක
ii. පාර්ලිමේන්තුව පත් වී අවම වශයෙන් වසර හතර හමාරක් ගත වූ පසුවය.
iii. පාර්ලිමේන්තුව පත් වී අවම වශයෙන් වසරක කාලයක් ගත වූ පසුව ය.
iv. පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතු යැයි අගමැතිවරයා ඉල්ලා සිටි විටක ය.

29) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව තුළින් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් අංගයක් වන්නේ ,

i. නාම මාත්‍ර විධායකභා ජනාධිපති තනතුර
ii. විධායක බලය සහිත ජනාධිපති තනතුර
iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම
iv. ශ්‍රී ලංකාව ස්වාධීන ජනරජයක්බවට පත් කිරීම

30) ශ්‍රී ලංකාවේ අභියාචනා කිරීමේ අවසරය ඇති අවසාන අධිකරණ බලය හිමි ආයතනය වන්නේ,

i. ශ්‍රේෂ්ඨාධිකරණයයි. ii. මහාධිකරණයයි.
iii. අභියාචනාධිකරණයයි. iv. මහේස්ත්‍රාත් අධිකරණයයි.

31) ශ්‍රී ලංකාවේ සන්නද්ධ සේවාවන්ගේ සේනා විධායකයා ලෙස කටයුතු කරන තැනැත්තා කවරෙක් ද?

i. සේනාධිපති ii. ආරක්ෂක ඇමති iii. විධායක ජනාධිපති iv. අගමැති

32) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත්වන අවස්ථා 'අ'තීරුවේ ද වර්ෂ'ආ' තීරුවේ ද සඳහන් කර ඇත. මේවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| i. බ්‍රිතාන්‍යයේ මැග්නාකාර්ටා ගිවිසුම | A වර්ෂ 1789 |
| ii. ඇමෙරිකානු නිදහස් ප්‍රකාශය | B වර්ෂ 1917 |
| iii. ප්‍රංශ ප්‍රකාශය | C වර්ෂ 1215 |
| iv. රුසියානු විප්ලවය | D වර්ෂ 1776 |

i. ABDC ii. ACBD iii. CDBA iv. CDAB

33) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පළමුවන වගන්තියේ සඳහන් කරුණ කුමක් ද?

i. ළමුන් කිසිදු වෙනස් කමකට භාජනය නොකළ යුතු ය.
ii. වයස අවුරුදු 18 අඩු සෑම මනුෂ්‍යයකුම ළමයෙකු ලෙස සැලකේ.
iii. ළමුන් සම්බන්ධව තීරණ ගන්නා විට ළමයාගේ උපරිම යහපත සලසා ක්‍රියා කළ යුතු ය.
iv. කිනම් ආකාරයකින් වුව ළමුන් පැහැර ගැනීම විකිණීම හෝ වෙළදාම් කිරීම වැළැක්වීමට රාජ්‍යයන් පියවර ගත යුතු ය.

34) ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස සැලකෙන කඩඉම් වයස ලෙස සැලකෙනුයේ,

i. 55 – 60 ii. 65- 70 iii. 50 – 60 iv. 60 -65

35) 1980 සම්මත කරන ලද පරිසර පණත මඟින් ආවරණය වන කේන්ද්‍රීය ආයතනය වන්නේ,

i. පරිසර අමාත්‍යාංශයයි. ii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි
iii. නාගරික සංවර්ධන අධිකාරියයි iv. මධ්‍යම පරිසර අධිකාරියයි

36) ‘කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතු ය.’ ඉහත ප්‍රකාශයෙන් පෙන්වා දී ඇත්තේ,

i. මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමාවක් නැති බවයි.

ii. මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමාවක් ඇති බවයි.

iii. අන්අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් මානව අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි බවයි.

iv. මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය නොහැකි බවයි.

37) පරිසරය සම්බන්ධ පුරවැසි වගකීමක් වන්නේ,

i. පරිසරය හා සම්බන්ධ නීති රාමුවට අනුකූලව කටයුතු කිරීමට පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීමයි.

ii. දැනුවත්කිරීමේ වැඩ සටහන් මඟින් පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීමයි.

iii. සංවර්ධන කටයුතු වලදී පරිසර පිරිවැය තක්සේරු කිරීමයි

iv. සෑම විටම පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීමයි.

38) පළාත් සභාවක මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,

i. මහ ඇමතිතුමා ය.

ii. ආණ්ඩුකාර වරයා ය

iii. පළාත් සභා ඇමතිතුමා ය.

iv. පළාත්සභා සභාපතිවරයා ය.

39) ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදාගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම ,

i. පරිභෝජනය නම්වේ.

ii. නිෂ්පාදනය නම්වේ.

iii. වෙළඳාම නම්වේ.

iv. බෙදාහැරීම නම්වේ.

40) සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවලට නිදසුන් නම්,

i. ශ්‍රී ලංකාව ii. මහා බ්‍රිතාන්‍යය iii. ප්‍රංශය iv. ඇමරිකා එක්සත් ජනපදය

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - II පත්‍රය | කාලය : පැය දෙකයි |
|---|---|---|

නම :.................................................................................................

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) i. ක්‍රි.පූ 6 වන සියවසේ වජ්ජි ජනපදය පාලනයේ දී අනුගමනය කළ සප්ත අපරිහානී ධර්ම දෙකක් නම් කරන්න.

ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

iii. නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

iv. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු දෙකක් සඳහන් කරන්න.

v. සන්ධීය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

vi. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.

vii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න.

viii. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත් වී තිබෙන සෘණාත්මක බලපෑම් දෙකක් නම් කරන්න.

ix ශ්‍රී ලංකාවේ අධිකරණ ආයතනය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

x. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 20)

2) i. පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ දී ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. සමාජ ජීවන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වන ආකාරය කරුණු තුනක් මඟින් පෙන්වා ඉන් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05)

3) i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාව ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවතින රාජ්‍යයකට නිදසුන් කරුණු තුනක් මඟින් පෙන්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

4) i. භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොමු කර ගන්නා නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. අර්ථක්‍රම ප්‍රධාන කොටස් තුනකට වෙන් කර ඇත. එම කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

iii. තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 05)

5) i.නීතිය පිළිබඳ තොරතුරු සපයාගත හැකි මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන නීති වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව නීතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

6) i. මානව අයිතිවාසිකම් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. C-I-DAW "සීඩෝ "සම්මුතිය යටතේ කාන්තාවන්ට හිමි අයිතීන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. a. පාසලේ සාමාජියෙක් ලෙස ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.

b. පාසලේ සාමාජිකයෙකු ලෙස පාසල වෙනුවෙන් ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් සඳහන් කරන්න (ලකුණු 05)

7) i. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත් වූ රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළ දක්නට ලැබුණු ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාව ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)